ලංකාදීප

# පළාත් සභා ඡන්දයේ මැති - ඇමැති ඥාති ලයිස්තුව මැතිවරණ කොමසාරිස්ට

## පැෆරල් සංවිධානය පියවර ගනී

(විනීතා එම්. ගමගේ)

සබරගමුව, උතුරුමැද හා නැගෙනහිර පළාත් සභා මැතිවරණයේදී තරග වදින අපේක්ෂකයන් අතර සිටින මධ්‍යම ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ පවුල්වල සාමජිකයන් 17 දෙනකුගේ හා ප්‍රාදේශීය සභා සභාපතිවරුන් දහ දෙනකුගේ නම් හා විස්තර පැෆරල් සංවිධානය විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත යවා ඇත.

මෙහිදී කෑගල්ල දිස්ත්‍රික්කයේ පමණක් ජාතික තලයේ දේශපාලනඥයින්ගේ ඥාතීන් සත් දෙනෙක් තරග කරන බව පැෆරල් සංවිධානය මැතිවරණ කොමසාරිස්වරයා වෙත පෙන්වා දී තිබේ.

මැති ඇමති පුතුන් හය දෙනෙක්, දියණියක්, පියවරුන් තිදෙනෙක්, බෑණාවරු දෙදෙනෙක්, ස්වාමිපුරුෂයෙක්, සහෝදරියක්, සහෝදරයෙක්, මස්සිනා කෙනෙක් හා ඥාති සහෝදරයෙක්ද මේ පිරිස අතර සිටින බව පැෆරල් සංවිධානය පෙන්වා දී ඇත.

මේ තත්ත්වය යටතේ මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශ වාහන ඇතුළු අනකුත් සම්පත් තම ජයග්‍රහණය උදෙසා භාවිත කිරීමට මේ පිරිසට බොහෝ ඉඩකඩ ඇති බවද නාමයෝජනා භාරදී ඇති ප්‍රාදේශීය සභා සභාපතිවරු අදාළ ප්‍රාදේශීය සභාවල සම්පත් පාවිච්චි කිරීමටද ඉඩ ඇති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන්නැයි පැෆරල් සංවිධානය කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කර ඇත.